# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,492 - 2026 ජුනි මස 05 සිකුරාදා - 2026.06.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 2370 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 2396 |


*සැ. යු.* - ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත 2026.06.05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජුනි මස 26 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජුනි මස 12 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


2367 - B 82798 - (2026/06)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ෴ ෂඪ වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් ජේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

**වෙළඳ නාවික ලේකම් කාර්යාලය**

***වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම - 2026***

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ පුරප්පාඩු වී ඇති විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුර සඳහා මෙහි දෙවන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 01. විභාග පරීක්ෂක (ඉංජිනේරු) - කොන්ත්‍රාත් පදනම මත | 01 |

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය :- 2026.07.06

**01. බඳවා ගැනීමේ ක්‍රමය:**

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා, පුරප්පාඩු වූ තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. එහිදී යොදා ගනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය මෙම නිවේදනයේ අංක 05 යටතේ දක්වා ඇත.

**02. අවශ්‍ය සුදුසුකම්:**

**(i) අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් :**

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| විභාග පරීක්ෂක (ඉංජිනේරු) | ශ්‍රී ලංකාව හෝ එක්සත් රාජධානිය හෝ ඕස්ට්‍රේලියාව හෝ කැනඩාව හෝ චීනය හෝ ඉන්දියාව හෝ පකිස්ථානය හෝ නවසීලන්තය හෝ මලයාසියාව හෝ සිංගප්පූරුව හෝ දකුණු අප්‍රිකාව හෝ අයර්ලන්තය යන රටවල හෝ අදාළ සහතික පිළිගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමඟ ද්විපාර්ශික ගිවිසුම්වලට එළඹ ඇති රටක රාජ්‍ය නාවික පරිපාලන ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ ප්‍රධාන ඉංජිනේරු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම. | කිලෝවොට් 3000ට වැඩි ධාරිතාවක් ඇති ප්‍රධාන එන්ජිමක් සතු සාගර තරණයෙහි යෙදෙන වෙළඳ නෞකාවක ප්‍රධාන ඉංජිනේරුවකු වශයෙන් වසර 02 ක අවම පළපුරුද්ද ලබා තිබීම. |

**(ii) කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**(iii)** **වයස් සීමාව :** අදාළ නැත.

**(iv)** **වෙනත් සුදුසුකම් :**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

***සටහන* -** අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් විසින් ඉහත සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:**

(i) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග හා වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටියට දැනටමත් කර ඇත්තාවූද, මතුවට කරනු ලබන්නාවූද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.

(ii) අයදුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

**04. වැටුප් පරිමාණය:**

මෙම තනතුරු සඳහා රු. 175,000.00 ක (මාසික) දීමනාවක් හිමිවන අතර එයට අමතරව මෙම තනතුරට ස්ථිරව පත් කෙරෙන නිලධාරියෙකුට නීත්‍යානුකූලව හිමි වරප්‍රසාද ද, පත්වීම බලාත්මකව පවත්නා කාලය තුළ හිමි වේ.

**05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ. :**

| *අනු අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **01** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | |
| | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා | 30 | **30** |
| | II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා | 20 | |
| | III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නාවුක විද්‍යාව හෝ සාමුද්‍රික විද්‍යාව පිළිබඳ උපාධියක් සඳහා | 15 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |

| *අනු අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **02** | **වෘත්තීය සුදුසුකම් :**<br><br>සමුද්‍රීය සෝදිසි කිරීම, සාමුද්‍රික නීතිය හා රෙගුලාසි, සමුද්‍රීය පරීක්ෂණ හා විමර්ශන හෝ නාවික කටයුතු ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් යන ක්ෂේත්‍රයන්ට අදාළව රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් -<br><br>I. මාස 06ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>II. මාස 03ක් හෝ ඊට වැඩි හා මාස 06ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>III. මාස 03ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02ක් සඳහා ලකුණු ලබා දිය හැක) | 10<br><br>07<br><br>03 | **10** |
| **03** | **අතිරේක පළපුරුද්ද :**<br><br>I. බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සඳහන් අවම පළපුරුද්ද ඉක්මවූ පළපුරුදු කාලසීමාව වෙනුවෙන්<br><br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක්<br>- මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 02 | | **30** |
| **04** | **ක්ෂේත්‍රය සඳහා දායකත්වය :**<br><br>ක්ෂේත්‍රයට අදාළව ජාතික හෝ ජාත්‍යන්තරව පිළිගත් ශාස්ත්‍රීය සංග්‍රහයක පළ වූ පත්‍රිකාවක් හෝ පේටන්ට් අයිතිය සහිත නව සොයා ගැනීම් (විධිමත්/පිළිගත් අනුමැතියන් හෝ සහතික ඉදිරිපත් කළ යුතුය.) | 10 | **10** |
| **05** | **පරිගණක හැකියාව :**<br><br>සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, නෞකා යාත්‍රණ, නාවික විද්‍යාව, සාමුද්‍රීය විද්‍යාව හෝ පරිගණක ආශ්‍රිත පුහුණු කිරීම් හා පරීක්ෂණ පැවැත්වීම යන ක්ෂේත්‍රයන්ට අදාළ තොරතුරු තාක්ෂණය / පරිගණක පද්ධති/ පරිගණක යෙදුම් පිළිබඳ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් -<br><br>I. මාස 06ක් හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>II. මාස 03ක් හෝ ඊට වැඩි හා මාස 06ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා<br>III. මාස 03ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02ක් සඳහා ලකුණු ලබා දිය හැක) | 15<br><br>10<br><br>03 | **15** |
| **06** | **සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය සඳහා** | | **05** |
| | **එකතුව** | | **100** |

**06.** **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

II. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

III. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ. :-

a) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;

b) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**07.** **අයදුම්පත් ඉදිරිපත් කිරීම :-**

(i) අයදුම්පත් **2026.07.06** දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,
අංක 79,
ටෙක්නිකල් හන්දිය,
මරදාන පාර,
කොළඹ 10.

(ii) ඉදිරිපත් කළයුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත්, දෙවැනි පිටුව අංක 10 සිට 15 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙලකර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුර සඳහා අයදුම් කිරීම - (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු /දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ට අනුව,රු. 82,150/= ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**08.** ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**09.** පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්ලිව්. ඩබ්ලිව්. එස්. මංගල,
ලේකම්,
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

2026 මැයි මස 18 දින,
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01.

**ආදර්ශ අයදුම්පත්‍රය**

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ
.................................................................................................. තනතුර සඳහා අයදුම් පත්‍රය

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල-1/දෙමළ-2/ඉංග්‍රීසි-3)

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

**සටහන** : අයදුම් කරන භාෂා මාධ්‍යය වෙනස් කළ නොහැක.

---

01. අයදුම්කරුගේ නම:
    - (i.) මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : ....................................................................................
      (උදා- GUNAWARDHANA, H.M.S.K. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
    - (ii.) සම්පූර්ණ නම : ..........................................................................................................................
      (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
    - (iii.) සම්පූර්ණ නම : ..........................................................................................................................
      (සිංහලෙන් / දෙමළෙන්)

02. ලිපිනය හා දුරකථන අංකය:
    - (i.) කාර්යාලීය ලිපිනය : ..................................................................................................................
      දුරකතන අංකය : .................................................................
    - (ii.) පෞද්ගලික ලිපිනය : ..................................................................................................................
      දුරකතන අංකය : .................................................................
      ජංගම දුරකතන අංකය : .......................................................

03. උපන් දිනය :
    අවුරුද්ද : ............................ මාසය : .............................. දිනය : ...........................

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :
    අවුරුදු : ............................ මාස : ............................. දින : ............................

05. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................

06. ස්ත්‍රී / පුරුෂ භාවය : ........................................................

07. විවාහක/ අවිවාහක/ වැන්දඹු ද යන වග : ......................................................

08. අධ්‍යාපන සුදුසුකම් :

| *සුදුසුකම* | *සුදුසුකම් ලබාගත් වර්ෂය* | *විෂය ධාරාව* | *සාමාර්ථය* | *ආයතනයේ නම* | *වෙනත්* |
|---|---|---|---|---|---|
| | | | | | |

09. වෘත්තීය සුදුසුකම් :

| *සුදුසුකම* | *සුදුසුකම් ලබාගත් වර්ෂය* | *විෂය ධාරාව* | *සාමාර්ථය* | *ආයතනයේ නම* | *වෙනත්* |
|---|---|---|---|---|---|
| | | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර (පළමු පන්තියේ ප්‍රවීණතා සහතිකය ලබා ගත් පසු) :

*a.* *ආයතනික පළපුරුද්ද* :

| *සේවය කළ ආයතනය* | *තනතුර* | *එම තනතුරට අදාළ කාර්යයන් සැකෙවින්* | *සේවා කාලය* | *වෙනත්* |
|---|---|---|---|---|
| | | | | |

b. *නාවික වෘත්තීය පළපුරුද්ද* :

| *නෞකාවේ නම* | *නෞකාවේ ධාරිතාව* | *නෞකාවේ දරන ලද තනතුර* | *සේවා කාලය (පළමු පංතියේ ප්‍රවීණතා සහතිකය ලබා ගත් පසු සේවා කාලය පමණක් දක්වන්න)* | | *වෙනත්* |
|---|---|---|---|---|---|
| | | | *මාස* | *දිනය* | |
| | | | | | |

11. ක්ෂේත්‍රය පිළිබඳ දායකත්වය :
(ප්‍රකාශන හා නව සොයාගැනීම්)

12. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාවය :
(i.) උපාධිය ...................................................................................
(ii.) ඩිප්ලෝමාව ...................................................................................
(iii.) සහතික පත්‍ර පාඨමාලාව .......................................................................

13. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේද? ..........................................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. එසේම මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් වැරදි හෝ අසත්‍ය ඒවා බවට, බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවට හා බඳවා ගත් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට සිදු වන බවත් මම දනිමි.

.........................................,
අත්සන.

දිනය ..........................................

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත්කරන ................................. මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ ඇය ................................ දින මා ඉදිරිපිටදී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

නම -
තනතුර -
ලිපිනය -
දිනය -

15. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා පමණක් අදාළ වේ.)

මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන ...................................................... මහතා/ මහත්මිය/ මෙනවිය දැනට ............................ තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ/ ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක

බවත් , විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බව හා එසේ කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

............................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

............................................
දිනය

06 - 10

---

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

**වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ විකිරණ ශිල්පී තනතුර සඳහා අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026**

1. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ විකිරණ ශිල්පී අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ආයතනයක් මඟින් උපාධිය ලබා ඇති පහත සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායනික විද්‍යාව, කෘෂි විද්‍යාව, යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත්වීම;

(ආ) අවම ශාස්ත්‍රීය අගය 120 කින් යුත් විකිරණ විද්‍යාවේදී උපාධිය / විකිරණ ප්‍රතිකාරවේදී උපාධිය (B.Sc. Radiography / B.Sc. Radio Therapy) සම්පූර්ණ කිරීම;

(ඇ) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතු යි.

3. අනෙකුත් පොදු සුදුසුකම් :

(අ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය;

(ආ) තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය;

(ඇ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය;

(ඈ) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය;

(ඉ) 2026.07.01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු, වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු යි;

(ඊ) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර දිනයක් විය යුතු යි;

(උ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම, අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

4. අයදුම් කළ යුතු ක්‍රමය :

(අ) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පතේ ආකෘතිය අනුව ස්වකීය අයදුම්පත සකස් කළ යුතු අතර ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිත කළ යුතු ය. (අංක 01 සිට 07 දක්වා පළමු පිටුවේ ද, 08 සිට 13 දක්වා දෙවන පිටුවේ ද, 14 සිට 15 දක්වා තුන්වන පිටුවේ ද වන සේ අයදුම්පත සකස් කරගත යුතු ය.);

(ආ) අයදුම්පතේ “ලදුපත” ස්ථානයේ, ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ අංක 7041318 දරන “සෞඛ්‍ය ලේකම් විභාග ගාස්තු රැස්කිරීම” යන ගිණුමට රු.1,000.00 බැරකර එම ලදුපත නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපත ඇලවීමට පෙර එහි පිටපතක් තබා ගන්න);

(ඈ) අයදුම්පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු හෝ සාමදාන විනිශ්චකාරවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු හෝ නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් සේවයේ *ගැසට්* කරන ලද තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 8,54,880.00 ට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කළ යුතු ය;

(ඇ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අඟල් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක බහා එම කවරයේ ඉහළ කෙළවරේ **"වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ විකිරණ ශිල්පී තනතුරේ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026"** වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර, **2026.07.01** දිනට පෙර **අධ්‍යක්ෂ (පාලන) 02, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.

5. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්, ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මඟින් එවිය යුතු ය.

6. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. පුහුණු පාඨමාලාවට අදාළව ඉහතින් දක්වා ඇති උපාධිධාරීන්ගේ උපාධිය බලපවත්වන දිනය (Effective Date) හා උපාධියේ ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA) පදනම් කරගෙන කුසලතා ලේඛනය සකස් කර පුහුණු පාඨමාලාවට සුදුස්සන් තෝරාගනු ලැබේ. මෙම උපාධිධාරීන් බඳවා ගැනීමට අදාළව මීට පෙර නිකුත් කර ඇති *ගැසට්* නිවේදනයේ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වූ **2024.07.05** දිනට පසුව උපාධිය ලබා ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

08. පුරප්පාඩු සංඛ්‍යාවට වඩා උපාධිධාරීන් අයදුම් කර තිබේ නම් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාවට බඳවා ගැනීම සඳහා සාමාන්‍ය දැනීම හා අභියෝග්‍යතාව පිළිබඳ පැය 01 ක ප්‍රශ්න පත්‍රයකින් යුත් ලිඛිත විභාගයක් පවත්වා එම විභාගයේ දී දක්වන කුසලතාවය අනුව වෙන් කළ හැකි පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පුහුණුවට බඳවා ගැනීම සිදු කෙරේ.

09. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් / අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් හා එහි සහතික කරන ලද පිටපත් බැගින් ඉදිරිපත් කළ යුතු ය:-

I. උප්පැන්න සහතිකය;
II. උපාධි සහතිකයේ මුල් පිටපත (මෙහි සහතික කළ පිටපතක්) අයදුම්පත සමඟ ද අමුණා එවිය යුතු ය;
III. විස්තරාත්මක උපාධි සහතිකයේ (Transcript) මුල්පිටපත;
IV. අ.පො.ස (උ.පෙළ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකයේ මුල් පිටපත;
V. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය;
VI. වෛද්‍ය සභාවේ ලියාපදිංචිය (SLMC) සනාථ කිරීමේ සහතිකය.

10. පුහුණු කිරීමේ පරිපාටිය :

I. සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට මාස 06ක කාලයක් සඳහා රෝහල් හා වෙනත් ආයතන වෙත අනුයුක්ත කරනු ලැබේ.

II. අභ්‍යාසලාභීන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලටද යටත් වනු ඇත.

III. පුහුණුව ලබන කාලපරිච්ඡේදය අවසානයේ දී පුහුණුව සාර්ථකව නිම නොකරන, වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ තමන් අනුයුක්ත කරනු ලබන ආයතනයේ පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

IV. පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 විධිවිධාන අනුව දීමනා ගෙවනු ලැබේ.

V. පුහුණුවට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්,එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ පහක (05) කාලපරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය ලේකම්වරයා සමඟ ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. පුහුණු කාලසීමාව තුළදී පුහුණුව හැරගියහොත්, පුහුණුවෙන් පසු පත්වීම භාර නොගතහොත්, ඉහත III වගන්තියේ සඳහන් ආකාරයට පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ (පහක) කාල පරිච්ඡේදයක් අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් යන ඕනෑම හේතුවක දී පුහුණු කාලය තුළ දී ඔහුට / ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන වියහියදම්, ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහු / ඇය විසින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

11. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :

පුහුණුව අවසානයේ අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම සිදුකරන / නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්ව ය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කලහොත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන් පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු මත අදාළ තනතුරේ III වන පන්තියේ තනතුරට පත් කිරීමට කටයුතු කෙරේ. පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ තනතුරු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව MT-6-2025 හි පරිදි

රු. 54,120 -10x800-11x1190-10x1320-10x1350 -රු. 101,910/-

යන වැටුප් පරිමාණය හිමිවන අතර ගෙවීම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

12. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු ඉහත සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරින් පහකර ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. තවද පුහුණු කාලය තුළ දී ඔහුට/ ඇයට ගෙවන දීමනාව, රජය විසින් දරන වියහියදම්හි ගිවිසුමට හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

13. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවීමේ පළමු මාසය ඇතුලත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ නිලධාරින්ට අදාළවන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් රෙගුලාසි හා වෙනත් රෙගුලාසිවලට ද රජය විසින් වරින් වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

15. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටියි. ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස, කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මඟින් ආවරණයවන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්වයක් උදා වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

විශේෂඥ වෛද්‍ය **අනිල් ජාසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 මැයි මස 21 දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

**ආදර්ශ අයදුම්පත**

***වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ විකිරණ ශිල්පී තනතුර සඳහා අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම - 2026***

(අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලන්න)

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම :- ..........................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. A.B.C.SILVA

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..............................................................................

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :- ....................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :- .............................................................................. (පිටපතක් අමුණන්න)

3. තැපැල් ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියෙන්

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |

4. (අ) ස්ථිර ලිපිනය :-

| සිංහලෙන්/දෙමළෙන් | ඉංග්‍රීසියෙන් |
|---|---|
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |

(ආ) දුරකථන අංකය : ජංගම [ ]

ස්ථිර [ ]

(ඇ) පදිංචි දිස්ත්‍රික්කය :- සිංහලෙන්/දෙමළෙන් ........................ ඉංග්‍රීසියෙන් ..................................

(ඈ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවෙක්ද? ඔව්/නැත :- ...................................................

(ඉ) ඔව් නම් කොපමණ කලක පටන්ද? :- .........................................................................................

5. උපන් දිනය :- වර්ෂය ........................... මාසය ........................... දිනය .......................................
2026.07.01 දිනට වයස :- අවුරුදු ......................... මාස .......................... දින ................................

6. ස්ත්‍රී/පුරුෂ භාවය :- ස්ත්‍රී [ ] පුරුෂ [ ] (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

7. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද යන වග :- ඔව් [ ] නැත [ ] (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

8. විවාහක/අවිවාහක බව :- විවාහක [ ] අවිවාහක [ ] (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

9. අධ්‍යාපන සුදුසුකම් :-

| *අනු අංකය* | *සමත් වූ උපාධිය* | *සාමාර්ථය* | *ශ්‍රේණියේ සාමාන්‍ය අගය (GPA)හා උපාධිය බල පවත්වන දිනය* | *විශ්වවිද්‍යාලය* | *අධ්‍යන වර්ෂය* |
|---|---|---|---|---|---|
| | | | | | |

10. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) ලියාපදිංචි අංකය හා දිනය :- ....................................................

11. ලිඛිත විභාගයක් පැවැත්වුවහොත් පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍ය :- ................................

12. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද? ඔව් ☐ නැත ☐
(අදාළ කොටුවේ√ ලකුණ යොදන්න.)

"ඔව්" නම් විස්තර සපයන්න :- ..........................................................................................................

13. **අයදුම්කරුගේ සහතිකය :**

(අ) මා විසින් *ගැසට්* නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් බව ද මම දැන සිටිමි.

| |
|---|
| ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය ලේකම්වරයාගේ විභාග ගාස්තු රැස්කිරීම යන ගිණුමට අදාළ මුදල් ගෙවා එම ලදුපතෙහි මුල් පිටපත මෙම ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. |

……................................ ..............................................,
දිනය අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

14. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................. මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලික දන්නා හඳුනන බවද, ඔහු/ඇය .............................. දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

....................................... ..........................................,
දිනය සහතික කරන්නාගේ අත්සන,
සහතික කරන්නාගේ නිල මුද්‍රාව.

සහතික කරන නිලධරයාගේ සම්පූර්ණ නම : ............................................................................................
තනතුර : ..................................................................................................................................
ලිපිනය : ..................................................................................................................................

15. **ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න.)**

(i.) ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන .......................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ................................................ තනතුර දරන බව මින් සහතික කරමි.

(ii.) ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, ඔහු/මැය තනතුර සඳහා තෝරා ගත හොත් ඔහු/ඇය දරන තනතුරට නිදහස් කල හැකි/නොහැකි බව දන්වමි.

(iii.) එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිඳු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත්, ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

................................................ .............................................,
දිනය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම : ..........................................................................................
තනතුර :..................................................................................................................................
ලිපිනය : ................................................................................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව.

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණයේ (ප්‍රධාන නීති නිලධාරි) තනතුරට බඳවා ගැනීම - 2025**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණයේ ප්‍රධාන නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි සුදුසුකම්ලත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නීති නිලධාරින්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "අධ්‍යක්ෂ (පාලන) 07, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස උඩ කෙළවරේ "සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණය (ප්‍රධාන නීති නිලධාරි) තනතුරට බඳවා ගැනීම - 2025" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.07.03 දින වේ.**

***සටහන* :-** ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අහිතකර තත්වයන් අයදුම්කරුවන් විසින් ම විඳදරා ගත යුතු ය.

01. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහි දී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. මෙම තනතුරට I ශ්‍රේණියේ නීති නිලධාරින් අතුරින් සේවා පළපුරුද්ද සහ කුසලතාව අනුව පත් කරනු ලැබේ. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තුළ ප්‍රධාන නීති නිලධාරි තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරින් නොමැති විට රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නීති නිලධාරින් අතරින් සේවා පළපුරුද්ද සහ කුසලතාව මත බඳවා ගනු ලැබේ.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් එක් වර්ෂයක පරිවාස කාල සීමාවකට යටත් වේ.

III. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණය (නීති නිලධාරි/ ප්‍රධාන නීති නිලධාරි) සඳහාවන බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදු කර ඇති සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද යටත් වේ.

03. සුදුසුකම් :

***සටහන 01:*** සුදුසුකම් සලකා බලනු ලබනුයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වේ.

3.1 වෘත්තීය සුදුසුකම් :

රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ I වන ශ්‍රේණියේ නීති නිලධාරියකු වීම.

3.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

3.3 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. සේවය ස්ථිර කර තිබිය යුතු ය.
IV. අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට අයදුම්කරුවන් විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
V. මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට හැකි වීම.

04. වයස් සීමාව: අදාළ නැත

05. වැටුප් පරිමාණය : 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.133,570–16 x 3,900–රු. 195,970/- (SL-01-2025) (I ශ්‍රේණියේ) වේ. ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ :-

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. සේවා පළපුරුද්ද : | | | |
| I ශ්‍රේණියේ සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 05 බැගින්, මාස 06කට ලකුණු 2.5, මාස 03කට ලකුණු 1.25 | 50 | | |
| 02. කුසලතාවය : | | | |
| (i.) අධ්‍යාපන සුදුසුකම් (උපරිමය) | | | |
| - පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ ලබා ගත් | | | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව මත වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරු බඳවා ගනු ලැබේ. |
| - දර්ශනශූරි (PhD) උපාධිය සඳහා උපරිමය | 12 | | |
| - පශ්චාත් උපාධිය සඳහා උපරිමය | 10 | 30 | |
| - පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා උපරිමය | 08 | | |
| (ii.) නීති විෂය සම්බන්ධයෙන් දක්වන කුසලතාව | | | |
| - විෂයයට අදාළව සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ලබා දෙනු ලබන නීතිමය ගැටලුවක් විසඳීම | 07 | 10 | |
| - නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම | 03 | | |
| (iii.) සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | | | |
| - සාමාන්‍ය දැනීම හා බුද්ධිය | 05 | | |
| - පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව හා පෞරුෂත්වය | 05 | 10 | |
| මුළු ලකුණු | 100 | 100 | |

***සටහන 02:*** සුදුසුකම් සලකා බලනු ලබනුයේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වේ.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සුදුසුකම් සම්පූර්ණ කර ඇතැයි පූර්ව නිගමනය කරන අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින්ව පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ. :-

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

I. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 05 දක්වාත්, 02 පිටුව අංක 06 සිට 08 දක්වාත්, අනෙකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

II. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය **2026.07.03** වේ. අයදුම්පත් **2026.07.03** දිනට හෝ එදිනට ප්‍රථම "අධ්‍යක්ෂ (පාලන) 07, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් පස උඩ කෙළවරේ **"සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි ප්‍රධාන නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2025** යනුවෙන් සඳහන් කළ යුතු ය.

IV. මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු විද්‍යුත් තැපෑල මගින් සිදු කිරීමට ද ඉඩ ඇත. එම නිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම අනිවාර්ය වන අතර, ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

V. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

VI. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ. අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.)

09. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයන් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

11. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් යම් කරුණක් සම්බන්ධව හෝ එහි විධිවිධාන සලසා නොමැති කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

විශේෂඥ වෛද්‍ය **අනිල් ජාසිංහ,**
ලේකම් ,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 මැයි මස 21 දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385 , පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ -10.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණය (ප්‍රධාන නීති නිලධාරි) තනතුරට බඳවා ගැනීම - 2025

| |
|---|
| |

පදිංචි දිස්ත්‍රික්කය

**01.** 1.1 **අයදුම්කරුගේ මුලකුරු සමග නම** : Mr./Mrs./Miss............................................................................................
..........................................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. :Mr../~~Mrs./Miss~~. SILVA A.B.

1.2 සම්පූර්ණ නම : ..........................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................................................

1.3 සම්පූර්ණ නම : ..........................................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ...................................................................................................................................

**02.** 2.1 **ලිපිනය (පෞද්ගලික)** : ..............................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ...........................................................................................................................

2.2 ලිපිනය (පෞද්ගලික) : ..................................................................................................................................

(සිංහලෙන්/දෙමළෙන්) ...................................................................................................................................

2.3 ලිපිනය(රාජකාරී) : .......................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ...........................................................................................................................

2.4 ලිපිනය(රාජකාරී) : ...................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ...................................................................................
(රජයේ සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු ඔහුගේ රාජකාරී ලිපිනය යෙදිය යුතු ය. ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතු ය.)

2.5 දුරකථන අංකය (පෞද්ගලික : ..........................................................................................................................

2.6 දුරකතන අංකය (කාර්යාලීය) : ......................................................................................................................

2.7 විද්‍යුත් ලිපිනය (e-mail Address) : ................................................................................................................

**03.** 3.1 **උපන් දිනය :**

| වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3.2 අයදුම්පත භාර ගන්නා අවසාන දිනට වයස : අවු:..........මාස:.......... දින:.....

**04.** **ජාතික හැඳුනුම්පත් අංකය :** ........................................................

**05.** **ස්ත්‍රී/පුරුෂ භාවය :** ........................................................

**06.** **සුදුසුකම්** : විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට පත් වූ දිනය :

6.1 සේවා පළපුරුද්ද :

.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................

6.2 අදාළ අධ්‍යාපන සුදුසුකම/ සුදුසුකම් :

.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................
.................................................................................................................................................................

**07.** **අයදුම්කරුගේ සහතිකය** :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගුවන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් කිසිම වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

දිනය :................................ ............................................,
අයදුම්කරුගේ අත්සන.

**08.** **ආයතන ප්‍රධානියාගේ නිර්දේශය** :

i. අයදුම්කරු ලබා ඇති පැසසුම් හා දඬුවම් පිළිබඳ විස්තර මෙහි පහත දැක්වේ :

| *පැසසුම් හා ස්වභාවය* | *පැසසුම් ලබා ඇති දිනය* | *දඬුවම හා ස්වභාවය* | *දඬුවම් ලබා ඇති දිනය* |
|---|---|---|---|
| | | | |

ii. අයදුම්කරුගේ -

වැඩ : ඉතා හොඳයි/හොඳයි/සාමාන්‍යයි/සතුටුදායකයි.
හැසිරීම : ඉතා හොඳයි/හොඳයි/සාමාන්‍යයි/සතුටුදායකයි.
පැමිණීම : ඉතා හොඳයි/හොඳයි/සාමාන්‍යයි/සතුටුදායකයි.

iii. නිවාඩු විස්තරය

| අනියම් | විවේක | අඩ වැටුප් | වැටුප් රහිත |
|---|---|---|---|
| ............ | ............ | ................. | ................ |
| ……….. | ……….. | …………. | ............... |

අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සහ මා විසින් සපයා ඇති සියලු තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

දිනය : ....................................

............................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
තනතුර :
නිලමුද්‍රාව

**09.** දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි.) :

මෙම ඉල්ලුම්කරු වන.......................................................................................... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ ......................සිට සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත/තාවකාලික තනතුරක් දරයි. පසුගිය වසර ................ක කාලය තුළ ඔහු/ඇය වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද ඔහු/ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කොට නොමැති බවද ඉහත සඳහන් කර ඇති සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් පරීක්ෂා කර බැලූ බවද ඒවා නිවැරදි බවද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බවද...................දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවට ද මින් සහතික කරමි.

.................................................................,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම : ........................................................................................................

පදවි නාමය : ........................................................................................................

දිනය : ........................................................................................................

දෙපාර්තමේන්තුව /ආයතන : .........................................................................................
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

06 - 29/1

---

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2025**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු 01ක් පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, (පාලන) 07 ශාඛාව, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස උඩ කෙළවරේ **"සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2025"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

(*අ*) අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.07.03** දින වේ.

*සටහන*.- ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අහිතකර තත්ත්වයන් අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

01. **බඳවා ගැනීමේ ක්‍රමය**

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 6 යටතේ සඳහන්) ලකුණු දීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

**02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතු අතර, රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු ය.

III. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. නීති නිලධාරි III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

IV. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විධායක සේවා ගණය (නීති නිලධාරි/ ප්‍රධාන නීති නිලධාරි) සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට සිදුකර ඇති සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද යටත් වේ.

03. මෙම තනතුර සඳහා අයදුම් කරනු ලබන අයදුම්කරුවන් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

3.1 අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් :

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.

3.2 පළපුරුද්ද :
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර 03කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ වසර තුනකට නොඅඩු පහත දැක්වෙන කාර්යයන්වලට අදාළ පළපුරුද්ද ලබා තිබීම :-

i. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම;
ii. ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු;
iii. අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු;
iv. පනත්, කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු;
v. විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු.

***සටහන.-*** සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීමට ඉදිරිපත් කරන ලියකියවිලි එම පළපුරුද්ද ලැබූ කාලය පැහැදිලිව සඳහන් කර සහතික කරන තැනැත්තා රබර් මුද්‍රාව යොදා අත්සන් තළ යුතු ය.

3.3 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

3.4 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනයට අයදුම්කරුවන් විසින් තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
IV. මනා ලෙස ඉංග්‍රීසි භාෂාව හැසිරවීමට හැකියාව තිබිය යුතු ය.

04. වයස් සීමාව :

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

05. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.82,150 – 10 x 2,400 – 08 x 2,940 -17 x 3,900 – රු. 195,970/- වේ.

එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ. මීට අමතරව රජය අනුමත දීමනා ද හිමිවේ.

06. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කර ගනු ලැබේ.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම් | 15 | |
| 3. අතිරේක වෘත්තීය පළපුරුද්ද | 30 | |
| 4. තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 10 | |
| 5. භාෂා හැකියාව | 15 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාව | 10 | |
| එකතුව | 100 | |

6.1 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට අදාළ විස්තරාත්මක ලකුණු පටිපාටිය පහත පරිදි වේ :-

| *අනු අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br><br>(උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්, ඒ යටතේ අදාළ උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ)<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ උපාධිය -<br>• පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>• දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා<br>• දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා<br><br>(ආ) නීති විද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය -<br>• නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා<br>• නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා<br><br>**(සටහන :** ගෞරව සාමාර්ථයක් සහිතව අවසන් විභාගය සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු ලබා දෙනු ලැබේ.) | 20<br>15<br>10<br><br>20<br>15 | 20 |

| *අනු අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 02 | **අතිරේක වෘත්තීය සුදුසුකම් :** | | |
| | i. පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන නීති ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධියක් | 15 | |
| | ii. පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන නීති ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (එක් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවකට ලකුණු 7.5 බැගින් උපරිම ලකුණු 15) | 15 | 15 |
| | iii. පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන නීති ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 15) | 15 | |
| | iv. පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන නීති ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට නොඅඩු සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15) | 15 | |
| 03 | **අතිරේක වෘත්තීය පළපුරුද්ද :** | | |
| | නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද - මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02 (මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍ය වන වසර 03ක සේවා කාලය හැර) | | 30 |
| | එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක් | | |
| | **සටහන** : අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය. | | |
| 04 | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම:** | | |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාර තිබීම සඳහා | 10 | |
| | (ආ) රජය පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා | 08 | |
| | (ඇ) රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | | 10 |
| | - මාස 06/ පැය 720 | 06 | |
| | - මාස 03/ පැය 360 | 04 | |
| | **සටහන** : උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ | | |

| අනු අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 05 | **භාෂා හැකියාව :**<br><br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/ පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය<br><br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br><br>(වසර 01ක් හෝ පැය 1500)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br><br>- මාස 06/ පැය 720<br>- මාස 03/ පැය 360<br><br>**සටහන :** උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 15<br><br>10<br><br>07<br>05 | 15 |

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :

I. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇතැයි පූර්ව නිගමනය කරන අපේක්ෂකයින්ව පමණි.
II. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.
III. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර පිළිගනු ලැබේ :-

 I. ජාතික හැඳුනුම්පත;
 II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
 III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

08. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

I. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 06 දක්වාත් 02 පිටුව අංක 07 සිට 09 දක්වාත් අනෙකුත් කරුණු ඊළග පිටුවලටද වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

II. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026.07.03 වේ. අයදුම්පත් 2026.07.03 දිනට හෝ එදිනට ප්‍රථම "ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, (පාලන) 07 ශාඛාව, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් පස උඩ කෙළවරේ "සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2025" යනුවෙන් සඳහන් කළ යුතු ය.

IV. මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු විද්‍යුත් තැපැල මගින් සිදු කිරීමට ද ඉඩ ඇත. එම නිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම අනිවාර්යවන අතර ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

V. රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ /අධ්‍යාපන පරිපාලන සේවයේ /රජයේ ගණකාධිකාරී සේවයේ/ රු.854,880/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

VI. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

VII. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ. අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

(සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.)

09. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයන් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

11. තවද මෙම නිවේදනය මගින් ආවරණය නොවන යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් තීරණය කරනු ලැබේ.

විශේෂඥ වෛද්‍ය **අනිල් ජාසිංහ,**
ලේකම් ,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 මැයි මස 21 දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385 , පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ -10.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරී - III ශ්‍රේණිය තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2025

පදිංචි දිස්ත්‍රික්කය

**01.** 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම : Mr./Mrs./Miss..............................................................................
.............................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා. :Mr../~~Mrs./Miss~~. SILVA A.B.

1.2 සම්පූර්ණ නම : ..............................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................................................................................

1.3 සම්පූර්ණ නම : ..............................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) .....................................................................................................

**02.** 2.1 ලිපිනය (පෞද්ගලික) : ..................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................................................................................

2.2 ලිපිනය (පෞද්ගලික) : ...........................................................................................................................

(සිංහලෙන්/දෙමළෙන්) ...........................................................................................................................

2.3 ලිපිනය(රාජකාරී) : ...........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ...........................................................................................................................

2.4 ලිපිනය (රාජකාරී) : ..................................................................................

(සිංහලෙන්/දෙමළෙන්) ..................................................................................

ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතු ය.)

2.5 දුරකතන අංකය (පෞද්ගලික) : ...........................................................................................................................

2.6 දුරකතන අංකය (කාර්යාලීය) : ...........................................................................................................................

2.7 විද්‍යුත් ලිපිනය (e-mail Address) : ...........................................................................................................................

**03.** 3.1 උපන් දිනය:

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

වර්ෂය මාසය දිනය

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවු:..........මාස:.......... දින:.....

**04.** ජාතික හැඳුනුම්පත් අංකය : ............................................................

**05.** ස්ත්‍රී/පුරුෂ භාවය : ..........................................................

**06.** සුදුසුකම් :

6.1 *අදාළ අධ්‍යාපන සුදුසුකම් :*
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................

6.2 *වෘත්තීය සුදුසුකම් :*
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................................................

**07. අයදුම්කරුගේ සහතිකය :**

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම්

එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

දිනය :................................ ............................................,
අයදුම්කරුගේ අත්සන.

**08.** ***අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :***

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී......................................දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

............................................,
සහතික කරන්නාගේ අත්සන.
(රබර් මුද්‍රාවකින් සනාථ කල යුතු ය)

සම්පූර්ණ නම : ......................................................................................................
තනතුර : ......................................................................................................
ලිපිනය : ......................................................................................................

**09.** ***දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය :*** (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි. )

මෙම ඉල්ලුම්කරු වන.......................................................................... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/ආයතනයේ ............................................දින සිට සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/නොහරින බවද..........................දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මින් සහතික කරමි.

.....................................................,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම - ......................................................................................................
පදවි නාමය -......................................................................................................
දිනය -......................................................................................................
දෙපාර්තමේන්තුව /ආයතන -..........................................................................................
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

06 - 29/2

---

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

ආයුර්වේද වෛද්‍ය සභාව

**කළමනාකරණ සහකාර III ශ්‍රේණිය තාක්ෂණ නොවන (MA 1-2 ) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම - (දෙමළ මාධ්‍ය)**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මහරගම, නාවින්න පිහිටි ආයුර්වේද වෛද්‍ය සභාවේ ඉහත තනතුර සඳහා යෝග්‍ය පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම තනතුර ස්ථිර සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිත තනතුරකි.

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

i. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය;

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය;

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

*පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* :- 01 ( එකයි ) - මෙම තනතුර දෙමළ භාෂාවෙන් කටයුතු කිරීම සඳහා බඳවා ගනු ලැබේ. එම තනතුර

සඳහා අයදුම් කරනු ලබන තැනැත්තන් දෙමළ මාධ්‍යයෙන් පහත අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සිංහල භාෂාව පිළිබඳ දැනුම ද විශේෂ සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

| | |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | i. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී **සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් එකකට සම්මාන සාමාර්ථ** සහිතව එකවර විෂයන් හයකින් සමත්ව තිබීම;<br><br>*හා*<br><br>ii. අ.පො.ස. (උසස් පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර **විෂයයන් තුනක් සමත්ව තිබීම;**<br><br>iii. රජය පිළිගත් ආයතනයක මාස හයකට (06) නොඅඩු කාර්යාල මෘදුකාංග (Microsoft Office ) පිළිබඳ පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සළකනු ලැබේ. (සහතික මගින් සනාථ කළ යුතු ය.) |
| වයස | - අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි අය විය යුතු ය. |
| වැටුප් පරිමාණය | - ක.සේ.චක්‍රලේඛ අංක 01/2025 අනුව MA 1-2 වැටුප් කේතය හිමි තනතුරකි.<br><br>වැටුප් පරිමාණය : රු. **46,220 - 10x540 – 7x630 – 12x1,080 – 12x1,280 – රු. 84,350** වේ. (රජයේ අනුමත ජීවන වියදම් දීමනාව හා දිරි දීමනාව අතිරේකව ඇතුළත් වේ).<br><br>**2026.01.01 දිනට ආරම්භක වැටුප රු.43,312/- කි.** |
| බඳවා ගැනීමේ ක්‍රමවේදය | - සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, වසර තුනක 03 ක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පදනම මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ. |
| පත්වීම් බලධාරියා | - සභාපති, ආයුර්වේද වෛද්‍ය සභාව. |
| අයැදුම්කරන පිළිවෙල | - සියලුම ජීව දත්ත හා පළපුරුද්ද ඇතුළත් කොට මේ සමග අමුණා ඇති ආකෘතිය පරිදි තමා විසින්ම අයදුම්පත පිළියෙල කළ යුතු ය. ඉහතින් සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට පමණක් අදාළ අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ද අයදුම්පත හා අමුණා එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම්පස කෙලවරෙහි **"කළමනාකරණ සහකාර III ශ්‍රේණියට බඳවා ගැනීම - ආයුර්වේද වෛද්‍ය සභාව"** ලෙස සඳහන් කොට **2026 ජූලි මස 03 දිනට හෝ ඊට පෙර "සභාපති, ආයුර්වේද වෛද්‍ය සභාව, නාවින්න, මහරගම"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. |

ලබා දී ඇති උපදෙස් අනුව යොමු නොකරනු ලබන අයැදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර බඳවා ගැනීම පිළිබඳ අවසාන තීරණය ආයුර්වේද වෛද්‍ය සභාව සතු ය.

**ඒ.එම්.ජී.එන්. දීප්ති සුමනසේන,**
සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව,
ආයුර්වේද කොමසාරිස් ජනරාල්.

2026 ජුනි මස 02 වැනි දින ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී ය.

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

***ආයුර්වේද වෛද්‍ය සභාව***

| |
|---|
| |

(*කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි*)

කළමනාකරණ සහකාර III ශ්‍රේණිය - තාක්ෂණ නොවන ( MA 1-2 ) තනතුර සඳහා අයදුම්පත

| | | |
|---|---|---|
| 1.0 | 1.1. සම්පූර්ණ නම : | |
| | 1.2. මුලකුරු සමග නම : | |
| 2.0 | 2.1. ස්ථිර ලිපිනය : | |
| | 2.2. දිස්ත්‍රික්කය : | |
| 3.0 | 3.1. ස්ත්‍රී / පුරුෂ භාවය : | |
| | 3.2. ජාතික හැඳුනුම්පත් අංකය : | |
| 4.0 | 4.1. ජංගම දුරකතන අංකය : | |
| | 4.2. ස්ථාවර දුරකතන අංකය : | |
| 5.0 | 5.1. උපන් දිනය : | |
| | 5.2. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස : | |
| 6.0 | 6.1. විවාහක / අවිවාහක බව : | |

**7.0** ***අධ්‍යාපන සුදුසුකම්*** ( භාෂා මාධ්‍ය සහිතව ) : භාෂා මාධ්‍ය : ...........................

( අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් එකකට සම්මාන සාමාර්ථ සහිතව **එකවර** විෂයයන් හයකින් සමත්ව තිබිය යුතු ය.)

| අ.පො.ස.(සා.පෙළ) වර්ෂය : .............................. | | විභාග අංකය : .......................................... | |
|---|---|---|---|
| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(අ.පො.ස. (උසස් පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර **විෂයයන් තුනක් සමත්ව තිබිය යුතු ය.)**

| අ.පො.ස.(උ.පෙළ) වර්ෂය : .............................. | | විභාග අංකය : .......................................... | |
|---|---|---|---|
| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
| | | | |
| | | | |
| | | | |

8.0. භාෂා ප්‍රවීණතාවය :

| *භාෂාව* | *කියවීම* | *ලිවීම* | *කථනය* |
|---|---|---|---|
| (අ). සිංහල භාෂාව | | | |
| (ආ). දෙමළ භාෂාව | | | |
| (ඇ). ඉංග්‍රීසි භාෂාව | | | |
| (ඈ). වෙනත් විදේශ භාෂා | | | |

9.0 හැකියාවන්:

9.1 පරිගණක සාක්ෂරතාවය ( විස්තර සඳහන් කරන්න ) (රජය පිළිගත් ආයතනයක මාස හයකට (06) නොඅඩු කාර්යාල මෘදුකාංග ( Microsoft Office ) පිළිබඳ පරිගණක පාඨමාලාවක් හදාරා තිබිය යුතු ය.)
……………………………………………………………………………………………………………...
……………………………………………………………………………………………………………...

10.0 වෙනත් සුදුසුකම් :
……………………………………………………………………………………………………………..
……………………………………………………………………………………………………………..

11.0 අයදුම්කරුගේ / අයදුම්කාරියගේ සහතිකය:

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් වැරදි හෝ සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව හෝ හෙළි වුවහොත් මාගේ අපේක්ෂකත්වය / හෝ පත්වීම අවලංගු කිරීමේ අයිතිය ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපතිවරයා සතු බව දනිමි.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් පවතින නීති රීතිවලට බැඳී සිටීමට හා නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගිය හොත් බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව හෝ මාගේ අපේක්ෂකත්වය / පත්වීම අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට යටත් වන බවට මම එකඟ වෙමි.

..............................................................,
අයදුම්කරුගේ / අයදුම්කාරියගේ අත්සන.

දිනය:…………………………………...

06 - 93

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සංශෝධනයයි**

**ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

අංක 2482 දරන 2026 මාර්තු මස 27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද " ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ II ශ්‍රේණියේ සහ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025" විභාග නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

02. ඒ අනුව, 5.0.1 ඡේදයෙහි සඳහන් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය **2026.06.19 දක්වා** දීර්ඝ කරනු ලබන අතර මෙම විභාගය **2026 අගෝස්තු මාසයේ දී** පැවැත්වීමට කටයුතු කෙරේ.

03. එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන නොවෙනස්ව බලපැවැත්වෙන අතර, මේ වනවිටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති නිලධාරින් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු කිරීමට අවශ්‍ය නොවන බව නිවේදනය කරනු ලැබේ.

**එන්. යූ. නිශාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2026 මැයි මස 29 දින,
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
06 - 08

## ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - වෘත්තීය අධ්‍යාපන අංශය

### ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණකාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2026 වර්ෂය

2026 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුළත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. (අ) වයස : 2026.07.05 දිනට අවුරුදු 16ත් 22ත් අතර විය යුතු ය. :

(ආ) අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත් වීම;

*හෝ*

ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06ක් එකවර සමත් වීම.

විශේෂ කුසලතා :

විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පළාත් මට්ටමේ තරග වලින් ප්‍රථම ස්ථාන 03 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ඉහත ක්ෂේත්‍රයන්ගෙන් ජාතික මට්ටමේ තරග වලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහළ ජයග්‍රහණයක් ලබා ඇති අයදුම්කරුවන් ඉහත -

(ආ) සුදුසුකම් දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්ය;

(ඇ) *සැ.යු.* - ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමග වසර 03ක් හෝ වැඩි කාලයකට ගිවිසුම්ගත අය මෙ සඳහා ඉල්ලුම් නොකළ යුතු ය.

02. පාඨමාලා මාධ්‍යය :

මෙහි දැක්වෙන සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර, මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පවත්වනු ලැබේ.

සෛද්ධාන්තික දේශන ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද පැවැත්වේ.

03. ඇතුළත් කර ගැනීමේ පරීක්ෂණය :

අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. -

(අ) විභාගය පවත්වන මාධ්‍යය : සිංහල / දෙමළ

(ආ) විභාග මධ්‍යස්ථාන : කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල සහ අනුරාධපුරය

(ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති මධ්‍යස්ථානවලින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් වෙනත් මධ්‍යස්ථානයකට යොමු කරනු ඇත)

විභාගයට අදාළ විෂයයන්

ඇතුළත්වීමේ විභාග ප්‍රශ්න පත්‍රය ගණිතය, බුද්ධි පරීක්ෂණය, කාර්මික දැනුම, කාර්මික ඇඳීම, පරිගණක දැනුම සහ ඉංග්‍රීසි භාෂා දැනුම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

04. විභාග ගාස්තු :

අයදුම්පතෙහි සඳහන් ක්‍රමවේදයට අනුව විභාග ගාස්තු වශයෙන් රු.1000/- ක මුදලක් ගෙවිය යුතු ය. මෙම ක්‍රමවේදය හරහා හැර වෙනත් කිසිඳු ක්‍රමයකට ගෙවන ලද විභාග ගාස්තු පිළිගනු නොලැබේ.

ඇතුළත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා ගෙවන ලද විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

05. මූලික තෝරාගැනීම :

ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතා පදනම මත යෝග්‍යතා (ප්‍රායෝගික) හා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මගින් තීරණය කරනු ඇත. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ)

06. අවසන් තෝරා ගැනීම :

යෝග්‍යතා (ප්‍රායෝගික) හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත අවසන් තෝරා ගැනීම සිදු කරනු ඇත. ලකුණු ලබා දෙනු ලබන්නේ

යෝග්‍යතා (ප්‍රායෝගික) පරීක්ෂණය සඳහා 40% ක් ද, සම්මුඛ පරීක්ෂණය සඳහා 50% ක් ද, බඳවාගැනීම සඳහා ඔබ පෙනී සිටි ලිඛිත පරීක්ෂණයෙන් 10% ක් ද වශයෙනි. සම්මුඛ පරීක්ෂණයේදී විෂය බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යටත්ව පුහුණු පාඨමාලා සඳහා බඳවා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතු ය.

07. පුහුණු පාඨමාලා :

| *අනු. අංකය* | *පාඨමාලාව* | *කාලසීමාව (අවුරුදු)* |
|---|---|---|
| 01 | මෝටර්රථ තාක්ෂණ ශිල්පී Automobile Technician | 04 |
| 02 | මිල්රයිට් තාක්ෂණ ශිල්පී Millwright Technician | 04 |
| 03 | වායු සමීකරණ සහ ශීතකරණ තාක්ෂණ ශිල්පී Refrigeration & Air Conditioning Technician | 03 1/2 |
| 04 | බල විදුලි තාක්ෂණ ශිල්පී (කර්මාන්තගත) Power Electrical Technician (Industrial) | 03 1/2 |
| 05 | යන්ත්‍රණ ශිල්පී Machinist | 03 1/2 |
| 06 | කර්මාන්තගත මෙකාට්‍රොනික් තාක්ෂණ ශිල්පී Industrial Mechatronics Technician | 03 1/2 |
| 07 | ඩීසල් තාක්ෂණ ශිල්පී Diesel Technician | 03 |
| 08 | වාහන විදුලි ශිල්පී Automobile Electrician | 03 |
| 09 | පෑස්සුම් ශිල්පී Welder | 03 |
| 10 | මෝටර් වාහන බොඩි අලුත්වැඩියා හා පින්තාරු ශිල්පී Motor Vehicle Body Repairer & Painter | 03 |

ආයතනයට ඇතුළත් කර ගැනීමෙන් පසු ඔබ ලබා දෙන පාඨමාලාවන් හි කැමැත්තේ අනුපිළිවෙළට සහ ආයතනයට ඇතුළත්වීමට පැවැත්වූ ලිඛිත පරීක්ෂණයට ලබාගත් ලකුණු සහ ප්‍රාථමික පුහුණු කාල සීමාව තුළ පැමිණීම මත ලබා දෙන ලකුණු පදනම්ව තමාට හිමි වෘත්තීය පාඨමාලාව ලැබෙනු ඇත.

08. ගිවිසුම් අත්සන් කිරීම :

ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාළව අවු 03, 03 1/2, 04 ක් වූ පාඨමාලා සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹිය යුතු ය.

09. අයදුම් කිරීම සඳහා උපදෙස් :

සියලුම අයදුම්කරුවන් අයදුම් කිරීම සිදු කළ යුත්තේ මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ පමණක් වේ.

*සැ.යු.* - අයදුම්කරුවන් තමන්ට හිමි Whatsapp දුරකථන අංකය පමණක් භාවිත කළ යුතු ය.

මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් සිදු කළ යුතු වන අතර, අදාළ මාර්ගගත ක්‍රමය (Online System) සඳහා පිවිසීමට පහත සඳහන් සබැඳිය භාවිත කළ යුතු වේ.

https://fta.germantec.lk

තාක්ෂණික විමසීම් : 0701 640 650 (පෙ.ව. 08.00 සිට ප.ව.06.00 දක්වා) මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම් කිරීමට පෙර අදාළ සබැඳියෙහි දක්වා ඇති උපදෙස් අනුගමනය කරමින් අයදුම් කිරීම සිදු කළ යුතු ය. සෑම අයදුම්කරුවකුටම මාර්ගගත ක්‍රමය (Online System) හරහා අයදුම්කළ පසු එම අයදුම්පතෙහි පිටපතක් මුද්‍රණය කර ලබා ගැනීමේ හැකියාව සලසා දී ඇති අතර, එසේ ලබා ගන්නා දෘඩ පිටපත (Hard Copy – PDF) සමඟ පහත සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා පහතින් දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් යොමු කළ යුතු ය. :-

(I) උප්පැන්න සහතිකය;
(II) අ.පො.ස. සාමාන්‍ය පෙළ සහතිකය;
(III) ඉහත අංක 01හි විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් නිකුත් කර ඇති පළාත්/ජාතික මට්ටමේ සහතිකය.

අයදුම්පත් එවීමේ දී ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම - 2026" යනුවෙන් සඳහන් කළ යුතු ය.

ඉහත ලබා දී ඇති උපදෙස් පිළිබඳව අවධානයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් පත්වන අපහසුතාවය පිළිබඳව ආයතනය කිසිදු වගකීමක් දරනු නොලබන අතර,

අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු කූට හෝ වංචනික බවට හෙළිවුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලබන අතර, මින් ඉදිරියට ආයතනයේ විභාග සඳහාද නුසුදුස්සකු වනු ඇත.

වැඩිදුර විස්තර සඳහා www.germantec.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

10. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය :

අංක 09 හි ඇති සබැඳියෙහි (link) දක්වා ඇති උපදෙස් පත්‍රිකාව අනුගමනය කරමින් 2026.07.05 දින හෝ එදිනට පෙර මාර්ගගත ක්‍රමය (Online System) ඔස්සේ අයදුම් කිරීම සම්පූර්ණ කළ යුතු ය.

11. විභාග ප්‍රවේශපත්‍ර :

සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගයට අදාළ විභාග ප්‍රවේශපත්‍ර **2026.09.08** දින වන විට ලැබීමට සලස්වන අතර, ඒ වනවිටත් ප්‍රවේශපත්‍ර නොලැබුණු අයදුම්කරුවන් වේ නම් එදින සිට දින 03ක් ඇතුළත පහත දුරකථන අංකයන්ගෙන් විමසිය යුතු ය.

ලේඛකාධිකාරී,
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය,
අංක 582, ගාලු පාර, ගල්කිස්ස,
(අඟුලාන හංදිය අසල).
දුරකථන අංක - 011-2605625 / 011-2605535 / 011-2623490.

06 - 48

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2026 වර්ෂය** | | | | | |
| **ජූනි** | 2026.06.05 | සිකුරාදා | 2026.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.12 | සිකුරාදා | 2026.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.19 | සිකුරාදා | 2026.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.06.26 | සිකුරාදා | 2026.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2026.07.03 | සිකුරාදා | 2026.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.10 | සිකුරාදා | 2026.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.17 | සිකුරාදා | 2026.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.24 | සිකුරාදා | 2026.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.07.31 | සිකුරාදා | 2026.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2026.08.07 | සිකුරාදා | 2026.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.14 | සිකුරාදා | 2026.07.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.21 | සිකුරාදා | 2026.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.08.28 | සිකුරාදා | 2026.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.